**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - 2017**

----------------------------------------------------

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2 මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය ව්‍යාවනය**

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

---

ප්‍රමිතයේ 71 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති රේඛීය අයිතම පිළිබඳ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සටහන් මගින් දැක්විය යුතු වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ කපාහැරීමට නියමිත ශේෂයන් ලෙස ඉදිරිපත් කර තිබූ රු.81,769,596 ක වටිනාකම පිළිබඳ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

---

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභයට ගැලපීම්කර නොමැති හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට ගැලපීම් කර තිබූ පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීම් රු.880,001 ක් වැරදි සහගත ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදීගැනීම සඳහා මුදල් ගෙවීම් රු.188,369,560 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන කටයුතු මුදල් ප්‍රවාහ යටතේ එය රු.194,797,384 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආයෝජන කටයුතු වලින් මුදල් ගලායෑම රු.6,427,824 කින් වැඩියෙන් පෙන්වා තිබුණි.

(iii) 2018 වර්ෂය වෙනුවෙන් එම වර්ෂයේදී ලැබී තිබූ රු.5,790,020 ක අමාත්‍යාංශ ප්‍රදාන සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ලැබීම් ප්‍රවාහයක් ලෙස පෙන්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

---

(i) සංස්ථාව විසින් 2017 වර්ෂයේදී මිලදීගත් එක්ස්කැවේටර් යන්ත්‍රයකට 2016 වර්ෂයේදී ගෙවන ලද රු.8,800,000 ක අත්තිකාරම් මුදල එම වර්ෂයේ වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කිරීමේ වරද නිවැරදි කිරීමේදී ප්‍රමිතයේ 47 වන ඡේදය ප්‍රකාරව පූර්ව වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදිකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 54 වන ඡේදය ප්‍රකාරව පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීමට අදාලව මූල්‍ය ප්‍රකාශන තුල සිදුකලයුතු හෙළිදරව් කිරීම් සංස්ථාව විසින් සිදුකර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

---

(i) ප්‍රමිතයේ 31 වන ඡේදය ප්‍රකාරව වත්කමක අපේක්ෂිත භාවිත තත්ත්වයට පත්කිරීම දක්වා වූ වියදම් පමණක් එහි පිරිවැයට ප්‍රාග්ධනිත කළහැකි වුවත්, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් ජංගම දොඹකර රථයෙහි රියදුරන් පුහුණු කිරීමේ දේශීය සහ විදේශීය පුහුණු වියදම් රු.730,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ දින සිට වත්කම් ක්ෂය කිරීම ආරම්භකල යුතු වුවත් සංස්ථාව විසින් ඊට පටහැනිව භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ දිනය නොසළකා මිලදීගත් වර්ෂය සඳහා වත්කම් ක්ෂය කිරීමට ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි.එසේ වුවද මිලදීගත් දිනයද නොසලකා පිරිවැය රු.6,373,607,912 ක් වූ වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.226,611,131 ක් ක්ෂය කර තිබුණි.

(iii) ප්‍රමිතයේ 70 ඡේදයෙහි සඳහන් සාධක සැලකිල්ලට ගෙන වත්කමක ඵලදායී ජීවිත කාලය නිශ්චය කළයුතු වුවත් ඊට පටහැනිව සංස්ථාව විසින් තාක්ෂණික හේතූන් මත සීඝ්‍රයෙන් යල්පැනීමට ලක්වන පරිගණක උපාංග වසර 10 ක කාලයක් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. තවද රු.30,209,500 ක් වූ වැලි කොට්ට යොදා සාදන ලද රළ කඩනයෙහි (Break Water) ඵලදායී ජීවකාලය ගලින් නිමකරන ලද රළකඩනයෙහි ජීව කාලය සේ සළකා වසර 40 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් සහ ක්‍රමක්ෂය ගැලපීමට අදාලව අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අඩමාණ ණය වෙන්කිරීම ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් කර තිබුණද, ණයගැතියන්ගෙන් අඩමාණ ණය සඳහා වෙන්කිරීම් ප්‍රමාණය හඳුනාගන්නා ආකාරය ප්‍රතිපත්තියට ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අඩමාණ ණය ලෙස රු.12,468,207 ක් වෙන්කර තිබුණි.

(ඇ) සංස්ථාව විසින් දේපල බදුදීමෙන් රු.37,846,862 ක බදු ආදායමක් උපයා තිබුණද බදු දුන් දේපල ගිණුම්ගත කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගෙන නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල නිමකර තිබූ වරායන්වල ඉදිකිරීම් 03 ක දී වැය කළ රු.8,699,100 ක් සහ දත්ත හුවමාරු පද්ධතිය සඳහා වූ මෘදුකාංග පැකේජය වෙනුවෙන් වැයකල රු.1,760,000 ක් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) දික්ඕවිට ධීවර වරායෙහි 2017 දෙසැම්බර් 31 දිනට භෞතිකව සත්‍යාපනය කරන ලද ඉන්ධන තොගය ලීටර් 64183 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය ලීටර් 75340 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන ඉන්ධන තොගය රු.1,028,117 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ඉන්වොයිස් කරන ලද උපදේශන ආදායම රු.2,048,728 ක් වුවද, ආදායම් ප්‍රකාශනයෙහි එම ආදායම රු.598,067 ක් ලෙස රු.1,450,661 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) අඩමාණ ණය ගණනය කිරීමේදී 2017 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.376,215,940 ක් වුවද රු.391,107,303 ක් ලෙස සලකා අඩමාණ ණය වෙන්කිරීම නිසා සත්‍ය ණයගැති ශේෂයට වඩා රු.14,891,363 ක ණයගැති ශේෂයට අඩමාණ ණය ප්‍රතිපාදනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අඩමාණ ණය ප්‍රතිපාදනය රු.255,095 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්**

(අ) 2017 වර්ෂය සඳහා බැංකු ගිණුම්වල ශේෂයන්ට අදාලව සකසන ලද සංශෝධිත මුදල් පොතෙහි ශේෂයන් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශේෂයන්හි පහත වෙනස්කම් පැවතුණි.

| විස්තරය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශේෂය 2017 දෙසැම්බර් 31 | සංශෝධිත මුදල් ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මීගමුවේ ඉන්ධන ගිණුම -8354 | 5,877,850 | 6,664,597 | 786,747 |
| පුරාණවැල්ල ඉන්ධන ගිණුම | 8,798,133 | 9,998,112 | 1,199,979 |
| කුඩාවැල්ල ඉන්ධන ගිණුම | - | 8,589,837 | 8,589,837 |

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට විශේෂ මුදල් අත්තිකාරම් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.16,876,317 ක් හා ලෙජර් ගිණුම් අනුව රු.17,023,273 ක් වීමෙන් රු.146,956 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව පෙරගෙවුම් ශේෂය රු.36,622,577 වුවත්, උපලේඛන අනුව රු.36,737,057 ක් වීමෙන් රු.114,480 ක වෙනසක් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ නැංගුරම් ගාස්තු ණයගැති ශේෂය රු.10,855,674 ක් වුවද , උපලේඛන අනුව එහි ශේෂය රු.10,110,624 වී තිබීමෙන් රු.745,050 ක වෙනසක් විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 6,465,171,321 | ස්ථාවර වත්කම් ලේඛනය, භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| තැන්පතු(ආරක්ෂක,ඉන්ධන, බැංකු සහතික, සිලින්ඩර් තැන්පතු හා වෙනත්) | 6,711,405 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථන |
| හඳුනා නොගත් වගකීම් | 1,653,400 | |
| ලියාහැරිය යුතු ශේෂයන් | 81,769,596 | |

| | | |
|---|---|---|
| ණයගැති ශේෂය | 376,215,940 | විස්තරාත්මක උපලේඛන |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ අරමුදල | 130,125,038 | විස්තරාත්මක උපලේඛන සහ යාවත්කාලීන කරන ලද ලේඛනය සහ ශේෂය සකස් වූ ආකාරය පිළිබඳ විස්තර |
| JICA අරමුදල | 19,992,903 | |
| ADB අරමුදල | 838,173,606 | |
| ධීවර දිරිසවිය අරමුදල | 12,032,951 | |
| අමාත්‍යාංශ ප්‍රදාන | 53,812,853 | |
| දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම් අරමුදල | 3,143,094 | |
| දික්ඕවිට අරමුදල | 4,644,670 | |
| විශේෂ අත්තිකාරම් (2015/12/31 දිනට පැවති) | 15,287,022 | |
| වැලි ආදායම මත ලැබියයුතු එකතුකල අගය මත බදු (වැට්) | 10,434,783 | |
| පෙරගෙවුම් (2016/12/31 දිනට) | 36,721,143 | විස්තරාත්මක උපලේඛන කාල විශ්ලේශණ , ශේෂ සනාථන |
| ලැබිය යුතු එකතු කළ අගය මත බදු | 4,753,933 | |

| | | |
|---|---|---|
| ණයහිමියෝ | 9,824,409 | විස්තරාත්මක උපලේඛන |
| ණයහිමියෝ - නිල්වැල්ල | 200,000 | |
| බදුකුලී ආදායම් | 36,258,737 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| වෙස්ටර්න් ග්‍රාන්ට් ආයතනය වෙත ගෙවියයුතු අත්තිකාරම් | 76,261,312 | |
| අනිකුත් තැන්පතු | 4,122,686 | |
| ණයහිමියෝ - ගම්පහ දිස්ත්‍රික් ධීවර සමූපකාරය | 204,656 | |
| අනිකුත් ණයහිමියෝ | 759,738 | |
| අබලි තෙල් ටැංකි | 133,864 | |

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව වරාය අධිකාරිය යටතේ පවතින ඔලුවිල් ධීවර වරායෙහි කැණීම් කටයුතු සඳහා 2016 දෙසැම්බර් 16 දින සිට 2017 මාර්තු 09 දින තෙක් යොදවා තිබුණද, ගිවිසුම් රහිතව අදාල කාර්යය සිදුකිරීම හේතුවෙන් ඒ සඳහා අධිකාරියෙන් සංස්ථාව වෙත ලැබිය යුතු රු.24,840,000 ක මුදල අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී ආදායම් ලෙස දක්වා තිබූ රු.75,012,091 ක වටිනාකම තුළ වර්ෂ 05 ට වැඩි ශේෂය රු. 21,532,211 ක් ද , වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර ශේෂය රු.27,543,347 ක් ද සමාලෝචිත වර්ෂයට අදාළව අයනොවී පැවති ශේෂය රු.25,936,533 ක් ද විය.

(ඇ) සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශයට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට සපයනු ලබන ආරක්ෂක සේවා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ශේෂය රු.49,609,330 කින් වර්ෂ 05 ට වැඩි ශේෂය රු.25,321,132 ක් ද ,වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර ශේෂය රු.7,670,999 ක් ද හා වර්ෂ 01 ට අඩු ශේෂය රු.16,617,199 ක් ද වූ අතර , මෙම මුදල් අය කරගැනීමේ කටයුතු මන්දගාමී තත්ත්වයේ පැවතුණි.

(ඈ) නැංගුරම් ණයගැති ශේෂ රු.47,311,629 ක් තුළ මෝදර ධීවර වරායට අදාළව පෞද්ගලික ආයතනයකින් වසර 03 ත් වසර 05 ත් අතර හා වසර 05 ට වැඩි ණය ශේෂ පිළිවෙලින් රු.14,468,415 ක් හා රු.32,843,214 ක් පවතින අතර මෙම ශේෂ අයකරගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) කොඩ්බේ ධීවර වරායෙහි සන්කෙන් නැව ඉවත්කිරීමට අදාළව පෞද්ගලික ආයතනයකින් වසර 05 කට අධික කාලයක සිට ලැබිය යුතු රු.2,150,000 ක් අයකරගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද අපොහොසත් වී තිබුණි.

(ඊ) වසර 05 ක කාලයක සිට පැවත එන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ආර්ථික සේවා බදු රු.10,512,971 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2014 සහ 2015 වර්ෂවලදී කාර්ය මණ්ඩලයට ලබාදී තිබූ එකතුව රු.39,873 ක වැටුප් අත්තිකාරම්ද රු.193,159 ක් වූ ගමන් වියදම් අත්තිකාරම්ද සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයේදී වරායන් 08 කින් ලැබිය යුතු හිඟ ආදායම් රු.5,439,310 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පැවති නිලධාරින් තිදෙනෙකුගෙන් එකතුව රු.499,109 ක් වූ සේවක ආපදාණය ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී අදාල නිලධාරීන්ගෙන් අයකරගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයෙහි II වැනි පරිච්ඡේදයෙහි 13.3 වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1(vii) ඡේදය | සංස්ථාවෙහි සැපයුම් කළමනාකාර තනතුරෙහි නිත්‍ය පත්වීමක් ලැබ තිබූ නිලධාරියා 2016 දෙසැම්බර් 10 දින විශ්‍රාම ගෙන තිබුණු අතර විගණිත දිනය වූ 2018 අගෝස්තු 27 දින දක්වාම ඒ සඳහා නිත්‍ය පත්වීමක් සිදු නොකර අවස්ථා 02 ක දී වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණි. කෙසේ වුවද මෙම නිලධාරියා විශ්‍රාම ගැනීමට පෙරසිටම එම තනතුර සඳහා වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණි. මෙසේ වැඩබැලීම් වෙනුවෙන් මාස 55 ක් සඳහා රු.389,051 ක් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 189 | (i) කුඩාවැල්ල ධීවර වරායේ චෙක් අගරු වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නැවත එම චෙක්පතට අදාළ මුදල මුදලින්ම ලබාගැනීමට කටයුතු කළ යුතු වුවත්, අවස්ථා 5 කදී වටිනාකම රු.1,311,063 ක් වෙනුවෙන් නැවත චෙක්පත් ලබාගෙන තිබුණි. එසේ ලබාදුන් චෙක්පත්වලින් නැවතත් රු.150,000 ක් හා රු.180,500 ක් වටිනා චෙක්පත් 02 ක් අඟරු වී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 454 | පොදු 44 වැනි ආකෘති පත්‍රය ප්‍රකාරව බඩු ලේඛන පොතක් පවත්වාගත යුතු වුවද ,සංස්ථාවේ වරායන් 22 ක් ඇතුළුව ප්‍රධාන කාර්යාලයේ උප කාර්යාල සඳහා වටිනාකම රු.144,269,604 ක් වූ ගෘහභාණ්ඩ කාර්යාල උපකරණ සහ අනෙකුත් උපකරණ සඳහා බඩු ලේඛන පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii)මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ගෙවීම සඳහා විධි විධාන පැහැදිලිව දක්වා තිබියදී, එයට අනුකූල නොවී 2011 දෙසැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2011 අදාල කරගනිමින්, සංස්ථාවෙහි ඉංජිනේරුවරුන් 05 දෙනෙකු වෙත වෘත්තීය දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සංස්ථාව විසින් චක්‍රලේඛයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ප්‍රවාහන දීමනා ලැබීමට හිමිකම් නොමැති MM1 -1 කාණ්ඩයේ නිලධාරීන් 21 දෙනෙකුට රු.10,000 බැගින්ද , තවත් MM1 -1 කාණ්ඩයේ නිලධාරීන් 03 දෙනෙකුට රු.5,000 බැගින්ද JM1-1 කාණ්ඩයේ නිලධාරීන් 11 දෙනෙකුට රු.1,500 බැගින්ද එකතුව රු.2,837,000 ක ප්‍රවාහන දීමනා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. |
| (ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.8 වගන්තිය | (i) 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය අධිකාරී බලය පැවරීමේ සීමාවන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මූල්‍ය වර්ෂය ආරම්භ වී මාස 03 ක් සහ දින 11 ක් ගතවී එනම් 2017 අප්‍රේල් 11 දින ලබාගෙන තිබුණි. |

(ii) 2017 අප්‍රේල් 11 දින පැවති 03 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාරයේදී ගෙවීම්පත් සඳහා බලය දීම සහ අනුමත කිරීමේ සීමාවන් යටතේ කළමනාකාර අධ්‍යක්ෂට රු.75,000 ක් දක්වා වන ගෙවීම් සඳහා පමණක් බලයදීමට හැකිබව දක්වා තිබියදීත්, එක්ස්කැවේටර් යන්ත්‍රය මිලදීගැනීම සඳහා සියයට 25 ක අත්තිකාරම් ලෙස ගෙවූ රු.මිලියන 07 ක් සඳහා කළමනාකාර අධ්‍යක්ෂ විසින් බලය ලබාදී තිබුණි.

| | |
|---|---|
| (ඊ) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරියෙකුට එක් අවස්ථාවකදී ලබාදිය හැකි අත්තිකාරම් මුදලෙහි උපරිම සීමාව රු.100,000 ක් වුවත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා අවස්ථා 38 කදී අත්තිකාරම් ලෙස එකතුව රු.7,389,950 ක් ලබාදී තිබුණි. අත්තිකාරම් ඉක්මවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (උ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතු වුවත්, එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඌ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.14.1 මාර්ගෝපදේශය සඳහා 2017 මාර්තු 15 දිනැතිව නිකුත්කරන ලද 33 වන අතිරේකය අනුව රු.200,000 වැඩි මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේදී ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා වන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පුද්ගලික අනුමැතිය ලබාගත යුතු වුවද එකී අනුමැතිය ලබා නොගෙන වාහන දෙකක් අලුත්වැඩියා කිරීම සඳහා රු.595,296 ක් සහ රු.329,062 ක් වැයකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.64,601,645 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.31,396,138 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.33,205,507 කින් වැඩිවී තිබුණි. පුනරාවර්තන ප්‍රදාන රු.1,000,000 කින් හා මෙහෙයුම් ආදායම් රු.22,384,939 කින් වැඩිවී තිබුණද පරිපාලන වියදම් හා කාර්ය මණ්ඩල පිරිවැය පිළිවෙලින් රු.41,630,998 කින් හා රු.3,917,210 කින් වැඩිවීම ඉහත අලාභය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභයක් ලබා තිබූ අතර එම අලාභය රු.167,049,439 ක සිට රු.64,601,645 ක් දක්වා අඛණ්ඩව අඩුවී තිබුණි. කෙසේ වුවද , මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.403,044,337 ක් වූ සංස්ථාවේ දායකත්වය ධන අගයක් සහිතව අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.865,509,623 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වසර 04 තුළ සංස්ථාවේ මුළු ආදායමෙන් රාජ්‍ය ප්‍රදානවල දායකත්වය සියයට 30.36 සිට සියයට 55.34 දක්වා වැඩිවී තිබුණු අතර ස්වයං උත්පාදිත ආදායම්වල දායකත්වය සියයට 69.64 සිට සියයට 44.65 දක්වා අඩුවී තිබුණි.

## 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර ආයතන හා පුද්ගලයින් 05 ක් විසින් ධීවර මත්ස්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන වෙනුවෙන් අයකරගතයුතු මුදල්, නැංගුරම් ගාස්තු, හදිසි අනතුරු වන්දි හා සේවය අත්හිටුවීම වෙනුවෙන් එකතුව රු.3,030,655 ක වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව අධිකරණවල නඩු 07 ක් ගොනුකර තිබුණි.

(ආ) හිඟ බදු කුලී අයකරගැනීම, ඉන්ධන ටැංකි 06 ක් සඳහා අත්තිකාරම් අයකරගැනීම , නැංගුරම් ගාස්තු අයකරගැනීම, ඉන්ධන ගාස්තු අයකරගැනීම වෙනුවෙන් සංස්ථාව විසින් බාහිර ආයතන 22 කට එරෙහිව එකතුව රු.35,607,695 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 22 ක් ගොනුකර තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

(අ) සංස්ථාවෙහි 2016 – 2020 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම පිළියෙලකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණේ 2017 ඔක්තෝබර් 13 දින දීය. කෙසේ වුවද සංයුක්ත සැලැස්මෙහි 2016 සහ 2017 වර්ෂ තුළදී ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

(ආ) සංස්ථාව විසින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මෙහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සංස්ථාවෙහි සාර්ව සහ සූක්ෂම පරිසරය විශ්ලේෂණය කරමින් සංස්ථාව සතු සම්පත් හඳුනාගැනීම සහ සංස්ථාවෙහි බාහිර පරිසරය පිළිබඳ විශ්ලේෂණය කිරීමක් සංයුක්ත සැලැස්මෙහි සිදුකර නොතිබුණි.

(ii) 2011 – 2015 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මෙහි මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය කිරීමක් සිදුකර නොතිබුණි.

(iii) සංස්ථාව ස්ථාපිත කරන ලද අරමුණු ඉටුකර ගැනීම සඳහා උචිත ක්‍රමෝපායන් හඳුනාගැනීමේදී සංස්ථාවෙහි උපාය මාර්ගික ව්‍යාපාර ඒකක හඳුනාගෙන මෙහෙයුම් මට්ටමින් ක්‍රමෝපායන් හඳුනාගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(iv) මේ හේතුවෙන් සංස්ථාවෙහි අභ්‍යන්තර පරිසරයේ පවතින දුර්වලතා මඟහරවා ගනිමින් බාහිර පරිසරයේ පවතින අවස්ථා හා තර්ජන වලට සාර්ථකව මුහුණදීමටත් සංස්ථාව ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකරගැනීම සඳහා තර්කානුකූලව ක්‍රමෝපායන් හඳුනාගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) තවද සංස්ථාව විසින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මෙහි සංස්ථාව පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට 2016- 2020 කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රමෝපායන් පැහැදිලිව හඳුනාගෙන ඒවායෙහි කාර්යසාධනය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වූ විෂය පථය සහ අපේක්ෂිත ප්‍රතිඵලය අපේක්ෂිත කාලසීමාව, සංස්ථාවේ වරායන් 21 ක වාර්ෂික ආදායම්, වියදම් කිරීමට අදාලව විස්තරාත්මක සැලසුම් ඇතුළත් කරමින් විස්තරාත්මක සැලසුම් පිළියෙල කර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 15 දින එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වූ අයවැය සීමාවන් සංශෝධනය කර තිබුණද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්ය සාධන වාර්තාව එම සංශෝධනයන්ට යටත්ව පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තිය හා 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ධීවරයින් වෙත ධීවර යාත්‍රා සඳහා අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම සංස්ථාවේ ප්‍රධාන අරමුණක් වුවද එම අරමුණ ඉටුකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් සිවිල් ඉංජිනේරු අංශයට සහ යාන්ත්‍රික අංශයට අයත් ක්‍රියාකාරකම් සහ එහි ප්‍රගතිය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) ගාල්ල ධීවර වරායෙහි අභ්‍යන්තර මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ලංසු ලියවිලි , ඉංජිනේරු ඇස්තමේන්තු 2017 ජනවාරි 11 දින පිළියෙල කර තිබුණද ඊට අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිලගණන් කැඳවීමට 2017 අගෝස්තු 08 තෙක් මාස 07 ක කාලයක් ගතකර තිබුණි. මේ හේතුවෙන් මාස 02 ක් වැනි කෙටි කාලයකින් අවසන් කළ යුතු මෙම අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීම් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම සඳහා මාස 10 ක කාලයක් ගතවී තිබුණි.

(ii) ධීවර වරායන්හි අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 12.62 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ගාල්ල හා බේරුවල ධීවර වරායන්හි අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිවෙලින් රු.මිලියන 6.4 ක හා රු.මිලියන 2.6 ක කොන්ත්‍රාත් වටිනාකමකට සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණද අනෙකුත් ධීවර වරායන්හි අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණු අතර රු.මිලියන 4 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(iii) ධීවර වරායන්හි සීමා තාප්ප (Boundary Walls) ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 5.34 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණද සීමා මායිම් නිවැරදිව හඳුනාගෙන සීමා තාප්ප ඉදිකිරීම සඳහා සැලසුම් පිළියෙල නොකිරීම හේතුවෙන් මෙම ඉදිකිරීම් වලදී මහජන විරෝධතා ඇතිවී තිබුණි. එම නිසා මෙම කොන්ත්‍රාත්තුව ආරම්භ වූ 2016 අප්‍රේල් 22 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපේක්ෂිත ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) සංස්ථාවට අයත් රුහුණු පුතා වැලි කැණීම් යාත්‍රාවේ වියළි තටාංගන අළුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී සිදුකිරීමට රු.මිලියන 26 ක ප්‍රතිපාදනයක් යටතේ රු.23,964,109 කට පෞද්ගලික ආයතනයකට ලබාදී තිබුණද, අළුත්වැඩියා කිරීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවසන්කර නොතිබුණි. 2018 ජුනි 05 දින අළුත්වැඩියා කටයුතු අවසන්කර තිබුණද, විගණිත දිනය වූ 2018 අගෝස්තු 30 දින වන විටත් යාත්‍රාව වැලි කැණීම් කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.2 වගන්තිය අනුව සෑම රජයේ ව්‍යාපාරයක්ම එහි වාර්ෂික කාර්ය සාධන ඇගයීමට සහ අධීක්ෂණය කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කල යුතු වුවද සංස්ථාවෙහි වාර්ෂික කාර්ය සාධනය ඇගයීමට සහ අධීක්ෂණය කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**
**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 අගෝස්තු 18 දින අම්බලන්ගොඩ වරායේ වැලි කැණීම් කිරීම සහ අලෙවිකිරීම බාහිර පාර්ශවයකට පවරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංස්ථාව සතුව ප්‍රමාණවත් කැණීම් යන්ත්‍ර නොතිබීම සහ පවත්නා යන්ත්‍රවල කාර්යක්ෂමතාවය අවම වීම, අක්‍රිය වීම නිසා පිරිවැය ඉහළ යෑම එසේ බාහිර පාර්ශවයකට පැවරීමට හේතු වශයෙන් දක්වා තිබුණද, සංස්ථාව සතුව ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කැණීම් යන්ත්‍ර 04 ක් තිබුණි.

(ii) මිළ කැඳවීම් දැන්වීමෙහි වැලි කැණීම් කිරීමට අදාල යන්ත්‍ර සූත්‍ර බාහිර පාර්ශවය සතු විය යුතු බව දක්වා තිබුණද, අදාල යන්ත්‍ර සූත්‍ර කොන්ත්‍රාත්කරු සතුව පැවතීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අදාළ අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් වැලි ඉවත්කිරීම සඳහා සී/ස සීනෝර් පදනම ආයතනයෙන් 2016 සැප්තැම්බර් 24 දින වැඩකරන පැයකට රු.11,000 බැගින් බදු පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍රය සංස්ථාව විසින් ලබාගෙන එය බාහිර පාර්ශවය වෙත පැයකට රු.3,500 බැගින් අවාසිදායක ලෙස බදු දී තිබුණි. මේ හේතුවෙන් සංස්ථාවට වූ මූල්‍යමය අලාභය රු.4,009,500 ක් විය. මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) බාහිර පාර්ශවය වෙත බදු දී තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය 2017 පෙබරවාරි 01 දින රු.මිලියන 28 ක් වැයකර සී/ස සීනෝර් පදනම ආයතනයෙන් ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් මිලදීගෙන එකී බාහිර පාර්ශවය වෙත අම්බලන්ගොඩ වරායේ වැලි ඉවත්කිරීම සඳහා 2017 ඔක්තෝබර් 03 දක්වා මෙම යන්ත්‍රය ලබාදී තිබුණි. මේ අනුව මිලදීගන්නා ලද එක්ස්කැවේටර් යන්ත්‍රය බාහිර පාර්ශවයේ අවශ්‍යතාවය සඳහාම මිලදීගෙන තිබූ අතර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් , ආයතන ප්‍රධානියා විසින් පත්කල යුතු වුවද , වැලි කැනීම් කර විකිණීම සඳහා ටෙන්ඩරයේ සහ රු.මිලියන 28 ක් වූ එක්ස්කැවේටර් යන්ත්‍ර මිලදීගැනීමේදී රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි උපදෙස් වලට පටහැනිව කළමනාකාර අධ්‍යක්ෂක විසින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් පත්කර තිබුණි.

(iv) වැලි කැණීම් කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව විසින් බාහිර පාර්ශවය සමඟ එළැඹී ගිවිසුමේ 03 කොන්දේසිය අනුව 2016 ඔක්තෝබර් 03 දින සිට මාස දොළහක කාලය තුල වැලිකියුබ් 7268 ක ප්‍රමාණයක් කැණීම් කළයුතු වුවද වැලි කියුබ් 4992.5 ක් පමණක් අදාල කාලය තුළ ඉවත්කර තිබීම නිසා වැලි කියුබ් එකක් රු.615 බැගින් විකිණීමෙන් ඉවත්නොකල වැලි කියුබ් 2275.5 කින් සංස්ථාවට අහිමි වූ ආදායම රු.1,399,432 ක් විය. ගිවිසුමේ 01 වන කොන්දේසිය අනුව ධීවර ප්‍රජාවගේ දෛනික කටයුතු පවත්වාගෙන යා හැකි වන පරිදි ධීවර වරායන් නඩත්තු කිරීම අරමුණු කරගෙන වැලි කැණීම් කටයුතු සිදුකිරීම හා ගොඩ දමන ලද වැලි ඉවත්කිරීමේ කාර්යය මාස දොළහක කාලය තුලදී ඉටුකර නොතිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ නිසා ධීවරයන්ට ධීවර යාත්‍රා වරාය බේසම තුලට ඇතුල්කිරීමට නොහැකි වී තිබුණි.

(v) ධීවර ජනතාවගේ අවශ්‍යතාවයන්වලට අනුකූල වන ලෙස කැණීම් කටයුතු සිදුකිරීම වෙනුවට , වැලි කැණීම්කරුගේ අවශ්‍යතාවය පරිදි වරාය බේසමේ සුළු ප්‍රදේශයක පමණක් කැණීම් කටයුතු කර ඇති බව භෞතික පරීක්ෂාවේදී තහවුරු විය. වරාය ආරම්භ වී වසර හතක් ගතවනතුරුත් අඛණ්ඩව වැලි පිරීම සිදුවන මෙම වරායෙහි වැලි ඉවත්කිරීමට අදාළව ක්‍රමවත් හා දිගුකාලීන විධිමත් වැඩපිළිවෙලක් සකස්කර ඒ මත කටයුතු කිරීමට පාලනාධිකාරය විගණිත දිනය වූ 2017 ඔක්තෝබර් 17 දින තෙක්ම අපොහොසත් වී තිබුණි.

(vi) 2017 ජූලි 18 දින පැවති ධීවර කමිටු රැස්වීමේදී වැලි ඉවත්කිරීමේ කටයුතු සම්බන්ධයෙන් සහ යාත්‍රාවල පතුල වැලි මත ගැටීම සම්බන්ධයෙන් වරාය කළමනාකරණය දැනුවත් කර තිබුණද , ඉන්පසුව හෝ වැලිකැණීම් කටයුතු නිසිපරිදි සිදුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට පාලනාධිකාරය පියවර ගෙන නොතිබුණි. මේ නිසා ධීවරයන්ට ඉන්ධන, ජලය හා වෙනත් පහසුකම් ලබාගැනීම සහ තම අස්වනු ගොඩබිමට රැගෙන ඒම සඳහා වරාය බේසමට ළඟා වීමට නොහැකි තත්ත්වයක් උදාවී තිබුණි. ඒ හේතුවෙන් ධීවරයන් නොයෙකුත් අපහසුතාවලට මුහුණ දෙන බව 2017 ඔක්තෝබර් 17 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) ප්‍රධාන කාර්යාලය හා ධීවර වරායන් අතර දත්ත හුවමාරු කිරීම සඳහා මෘදුකාංග පැකේජයක් ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2015 නොවැම්බර් 17 දින රු.950,000 ක කොන්ත්‍රාත් මුදලකට ගිවිසුම්ගත වී තිබුණු අතර පසුව හඳුනාගත් අවශ්‍යතා සඳහා මෘදුකාංග පැකේජයට කරන ලද නව එකතුකිරීම් වෙනුවෙන් 2016 අප්‍රේල් 27 දින රු.425,000 ක් සහ 2016 දෙසැම්බර් 01 දින රු.385,000 ක් වශයෙන් එකතුව වූ රු.810,000 ක් අතිරේකව ගෙවා තිබුණි. කෙසේ වුවද මෘදුකාංග පැකේජයේ දෝෂ හේතුවෙන් තොරතුරු යාවත්කාලීන කිරීමට ගැටළු පවතින බව ධීවර වරායන්හි කළමනාකරුවන් ප්‍රධාන කාර්යාලයට නිරන්තරව ලිපි යොමු කර තිබුණද අදාල ගිවිසුම පරිදි මෘදුකාංග පැකේජ නඩත්තු කටයුතු සහ පද්ධතියේ දෝෂ නිවැරදි කිරීම සඳහා සංස්ථාව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. තවද අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ධීවර වරායන්හි මූල්‍ය තොරතුරු, ආදායම් වියදම් සාරාංශ, මෘදුකාංග පැකේජය හරහා ලබාගැනීමක් සිදු නොවන බවද, නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ධීවර වරායන් 16 ක එකතුව රු.4,063,780 ක ඉන්ධන හිඟයක් සහ ධීවර වරායන් 09 ක එකතුව රු.1,055,824 ක ඉන්ධන අතිරික්තයක් පැවතුනු අතර ඉන්ධන තොගයෙහි එවැනි අසාමාන්‍ය ඌනතාවයන් සහ අතිරික්තයන් සඳහා හේතු හඳුනාගෙන එවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරීත්වය කටයුතුකර නොතිබුණි.

(ඈ) දොඩම්දූව ධීවර වරායේ ධීවර යාත්‍රාවල එංජින් ගබඩා කර තැබීම සඳහා ධීවරයින් වෙත බදු පදනම මත ලබාදීමට 2012 වර්ෂයේදී රු.2,848,128 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද එම ගොඩනැගිල්ලේ කාමර වෙන්කර නොතිබීම නිසා අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ රු.2,226,895 ක වියදමක්

දරා නැවත එම ගොඩනැගිල්ල කාමර 16 කට වෙන්කර 2017 ඔක්තෝබර් 19 වන දින සංස්ථාව වෙත භාරදී තිබුණද විගණිත දිනය වූ 2018 මාර්තු 20 වන විටත් මෙම ගොඩනැගිල්ලේ කාමර කිසිවක් බදු දී නොතිබුණි.

(ඉ) (i) දොඩම්දූව වරායෙහි ශීතාගාරය ආශ්‍රිතව තිබුණු අයිස් කඩන යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා 2012 මැයි 21 දින ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික ගබඩාව වෙත ගෙන ගොස් තිබුණු අතර විගණිත දිනය වූ 2018 මාර්තු 20 තෙක් වසර 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද එම යන්ත්‍රය අලුත්වැඩියා කර නැවත ධීවර වරාය වෙත ලබාගෙන නොතිබුණි.

(ii) ශීතාගාරයේ Compresser යන්ත්‍රය මාසයකට ආසන්න කාලයක් අක්‍රිය වී තිබූ අතර එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. වරායේ මාසික ආදායමෙන් වැඩි ප්‍රමාණයක් අයිස් අලෙවියෙන් ලැබෙන බැවින් ශීතාගාරය නිශ්ක්‍රියව පැවතීම වරාය අලාභ ලබමින් තිබෙන අවස්ථාවේ තවදුරටත් අලාභය වැඩිවීමට හේතුවන බව නිරීක්ෂණය විය.

(ඊ) සුදුවැල්ල ධීවර වරාය විසින් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 83 කදී ලීටර් 119,120 ක හා 2018 මැයි 09 දක්වා අවස්ථා 19 කදී ලීටර් 822,449 ක භූමිතෙල් ප්‍රමාණයක් ලියාපදිංචි ධීවරයින් නොවන පුද්ගලයින් වෙත නිකුත් කර තිබුණි. තවද 2018 මැයි 10 දින එම ධීවර වරාය විසින් භූමිතෙල් ලීටර් 2455 ක් පෞද්ගලික භූමිතෙල් අලෙවිකරන ස්ථානයකට නිකුත්කිරීමට වරාය කළමනාකාරීත්වය කටයුතු කර තිබුණි. 2018 මැයි 10 දින සිට භූමිතෙල් ලීටරයක මිල රු.57 කින් ඉහළ යන තොරතුරු වරාය කළමනාකරණය දැනුවත්ව තිබියදී මෙලෙස බාහිර පාර්ශවයන් වෙත සවස 5.00 න් පසුව ධීවර වරායේ කම්කරුවෙකු යොදාගෙන භූමිතෙල් ලීටර් 2455 ක් නිකුත් කර තිබීම හේතුවෙන් රු.139,935 ක අලාභයක් ද සංස්ථාවට සිදු වී තිබුණි.

(උ) 2017 වර්ෂයේදී අවස්ථා 83 ක දී භූමිතෙල් ලීටර් 119,120 ක් හා 2018 මැයි 09 දක්වා අවස්ථා 19 කදී භූමිතෙල් ලීටර් 22,449 ක් ව්‍යාජ ධීවරයන්ගේ නාම ලේඛනයක් සකස්කර සුදුවැල්ල ධීවර වරාය විසින් භූමිතෙල් නිකුත් කර තිබුණි.

(ඌ) පුරාණවැල්ල ධීවර වරායේ ආපනශාලාව බදු දීමේදී ටෙන්ඩරයේ කොන්දේසි අංක 05 අනුව අවම මාසික බදු කුලිය රු.96,599 ක මුදලකට 2017 මාර්තු 16 සිට වසරක කාලයකට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණද ගැණුම්කරු විසින් දෙන ලද අභියාචනයක් අනුව එම ටෙන්ඩර් කාලසීමාව තුලදීම එනම් 2017 අගෝස්තු 21 සිට 2018 අගෝස්තු 20 දක්වා මාසික බදු කුලිය රු.68,000 ලෙස බදු ගිවිසුම වෙනස්කර තිබුණි. මෙම මාසික බදු කුලිය ටෙන්ඩර් දැන්වීමේ දැක්වූ මාසික බදුකුලියට වඩා රු.28,599 ක් අඩුවෙන් අයකිරීම නිසා සංස්ථාවට මාසිකව රු.28,599 ක පාඩුවක් සිදුවී තිබුණි.

(එ) තංගල්ල ධීවර වරාය විසින් වරාය තුළ ධීවර යාත්‍රා සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ඉන්ධන අලෙවි සැලෙහි විගණිත දිනය වූ 2018 මාර්තු 05 දින ඩීසල් තොගය භෞතික පරීක්ෂාවේදී අලෙවි කිරීමට පෙර පැවති ඩීසල් තොගය ලීටර් 16,558 ක් වූ අතර එදිනට තොග පොත් අනුව ඉන්ධන තොගය ලීටර් 21,020 ක් විය. මේ අනුව ඉන්ධන තොගයේ ඌනතාවය ලීටර් 4,462 ක් හා වටිනාකම රු.423,890 ක් විය.

(ඒ) ගාල්ල ධීවර වරාය පරිශ්‍රය තුළ පිහිටි කුමාරසිංහ ගොඩනැගිල්ලේ වර්ග අඩි 210 ක් වූ කාමරයක් තුළ ගාල්ල දිස්ත්‍රික් ධීවර සමුපකාර සංගමය විසින් කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි.

(ඔ) දොඩම්දූව, සුදුවැල්ල, පුරාණවැල්ල හා නිල්වැල්ල යන වරායන්වල ආරක්ෂක සේප්පුවල තැන්පත් කර තැබීම සඳහාවූ රක්ෂිත මුදල් සීමාවන් පිළිවෙලින් රු.250,000 ක්, රු.1,200,000 ක්, රු.500,000 ක් සහ රු.1,500,000 ක් වූ අතර එකී සීමාවන් ඉක්මවා සේප්පුවේ මුදල් රඳවාගෙන තිබුණි. දොඩම්දූව ධීවර වරායේ අවස්ථා 8 ක දී රු.299,013 ක සිට රු.399,796 ක පරාසයකින්ද සුදුවැල්ල ධීවර වරායේ අවස්ථා දෙකකදී සීමාවන් ඉක්මවා ද සේප්පුවේ මුදල් තබාගෙන තිබුණි.

(ඕ) කුඩාවැල්ල ධීවර වරායේ බැංකු ගිණුමකට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී 2017 වර්ෂයේ ආරම්භයේ සිටම සෑම මසකම රු.514,340 ක අවිනිශ්චිත මුදල් ශේෂයක් පැවතුණද , ඒ පිළිබඳ පරීක්ෂා කර එම ශේෂය නිරවුල් කර නොතිබුණි.

(ක) 2017 වර්ෂයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 07 කට 2018 ඔක්තෝබර් 03 දින දක්වාම පිළිතුරු සපයා නොතිබුණි.

(ග) සංස්ථාව විසින් මාසික බදු කුලිය තීරණය කිරීම සඳහා රජයේ තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබාගැනීමෙන් තොරව අම්බලන්ගොඩ ධීවර වරායෙහි පර්චස් 40 ක භූමි ප්‍රමාණයක් 2011 දෙසැම්බර් 27 දින මාසික බදු කුලිය රු.100,000 කට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාමට අවුරුදු 20 ක කාලපරිච්ඡේදයක් සඳහා සහ පර්චස් 04 ක භූමි ප්‍රමාණයක් 2014 ජුනි 25 දින මාසික බදු කුලිය රු.10,000 කට ලිහිසිතෙල් අලෙවිකිරීමේ වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා අවුරුදු 09 මාස 05 ක කාලපරිච්ඡේදයක් සඳහා පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි.

(ත) පෙරගෙවීම් ලේඛනය අනුව, වසර 01 ට අඩු, වසර 01 ත් වසර 05 ත් අතර, වසර 05 ත් වසර 10 ත් අතර හා වර්ෂ 10 වැඩි පෙරගෙවීම් ශේෂ පිළිවෙලින් රු.620,880, රු.11,551,997, රු.6,598,719 හා රු.17,893,981 ක් වූ අතර, එම පෙරගෙවීම් නිරවුල් කිරීමට කළමනාකාරීත්වය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ද) හික්කඩුව ධීවර වරායේ යාත්‍රා කරමින් තිබියදී 2016 නොවැම්බර් 06 දින අනතුරකට පත්වූ සයුරි යාත්‍රාව, රක්ෂණය කර නොතිබීම හේතුවෙන් අනතුරින් පසුව සිදුකල අළුත්වැඩියා වෙනුවෙන් සංස්ථාවේ අරමුදලින් රු.5,800,000 ක් වැයකර තිබුණි.

(න) ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි දැනට වරායයන් 21 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් වරායන් 05 කට අයත් ඉඩම්වල අයිතිය පමණක් සංස්ථාව වෙත පවරාගෙන ඇති නමුත් ඉතිරි වරායන් වල ඉඩම් සංස්ථාව වෙත පවරා ගැනීම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සිදුවී නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**
**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) 2014 වර්ෂයට පෙර මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73ක් ඉපැයූ මෝදර ධීවර වරාය, 2014 ඔක්තෝබර් 30 දින සිට වසර 25 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයකට මෙහෙයුම් කල්බදු පදනමට පෞද්ගලික තක්සේරුකරුවකුගේ තක්සේරු වටිනාකම වූ රු.125,000 ක මාසික කුලියකට බදු දී තිබුණි.

(ii) සංස්ථාව සහ කල්බදු ගැනුම්කරු අතර 2015 ජුනි 10 දින ඇතිකරගත් අතිරේක ගිවිසුමෙහි කොන්දේසි අංක 03 අනුව කල්බදු ගැනුම්කරුගෙන් රජයේ තක්සේරුකරුගේ මාසික කල්බදු කුලිය අයකරන බවට එකඟ වී තිබූ අතර 2016 පෙබරවාරි 25 දින ලබාගත් රජයේ තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව අංක 7695 දරන පිඹුර පදනම්කර ගනිමින් මෝදර ධීවර වරායෙහි හෙක්ටයාර් 1.421 ක් වූ

භූමි ප්‍රමාණයෙහි කල්බදු කුලිය රු.1,700,000ක් ලෙස තක්සේරු කර තිබුණද රජයේ තක්සේරුකරුගේ මාසික බදු කුලිය අයනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.42,756,000 ක බදු ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි.

(iii) මෝදර ධීවර වරාය සඳහා රජයේ තක්සේරුකරුගේ වාර්තාව අංක 7695 දරන පිඹුරෙහි භූමි ප්‍රමාණය මත පදනම්ව තිබූ බවත් එය වරායෙහි බේසමද ඇතුලත්ව සම්පූර්ණ වරාය වෙනුවෙන්ම ඉදිරිපත්ව නොතිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය වූ අතර වරාය බේසම ඇතුළත්ව තක්සේරු වාර්තාවක් රජයේ තක්සේරුකරුගෙන් ලබාගැනීමට සංස්ථා කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකුවේ හා වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ආධාර මත රු.මිලියන 224 ක වියදමින් ඉදිකර සංස්ථාව වෙත ලබා දී ඇති හලාවත ධීවර වරායේ මෙහෙයුම් කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් 2017 මැයි මාසය දක්වා ධීවර වරායකින් ඉටුවිය යුතු මූලික අරමුණ වන ධීවරයන්ට සහන සැලසීම සිදුවී නොතිබුණි. කෙසේවුවද 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වරායේ මෙහෙයුම් කටයුතුවලින් සිදුවූ අලාභය රු.65,371,627 ක් වූ බැවින් ණය ආධාර මත ඉදිකළ මෙම වරාය වෙනුවෙන් ගෙවීමට ඇති විදේශීය ණය හා ඊට අදාල පොළිය ගෙවීම රජයට වැය බරක් වී තිබුණි.

(ඇ) සංස්ථාව යටතේ ක්‍රියාත්මක වන ධීවර වරායන් 21 න් වරායන් 15 ක් ම සමාලෝචිත වර්ෂය තුළ රු.150,964,219 ක මෙහෙයුම් අලාභ ලබා තිබූ අතර, එම වරායයන් 11 ක් ඉකුත් වර්ෂයේදීද අලාභ ලබා තිබුණි. තංගල්ල, හම්බන්තොට, සුදුවැල්ල, බේරුවල හා ගාල්ල ධීවර වරායන්හි මෙහෙයුම් අලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 10, සියයට 22, සියයට 17.5, සියයට 215 හා සියයට 231 කින් වැඩිවී තිබුණි. අලාභ ලබන වරායන්වල අලාභ ලැබීමට හේතූන් අධ්‍යයනය කර ලාභ ලබන තත්ත්වයකට ගෙන ඒමට හෝ අලාභ අඩුකර ගැනීමට හා ලාභය අඩුවෙමින් පවතින වරායන්වල ලාභය වැඩිකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) පුරාණවැල්ල ධීවර වරායේ ලියාපදිංචි යාත්‍රා 04 ක් සඳහා දොඹකර ගාස්තු ලෙස පාලක මණ්ඩල අනුමැතිය අනුව රු.47,000 බැගින් අයකළ යුතු වුවද රු.23,500 ක් පමණක් අයකර තිබුණි. ඒ අනුව එක් දොඹකරයකින් රු.23,500 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි.

(ඉ) පුරාණවැල්ල ධීවර වරාය විසින් ලංකා ධීවර සංස්ථාවට, ධීවර පරීක්ෂක කාර්යාලයට හා ලංකා අයිස් පුද්ගලික සමාගමට බදු දී තිබුණු ගොඩනැගිලිවලින් 2017 හා 2018 වර්ෂ සඳහා සහ 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා හිඟ බදු මුදල් හා ජලය හා විදුලිය ගාස්තු නියමිත පරිදි අයකර නොගැනීම හේතුවෙන් විගණිත දිනය වූ 2018 අප්‍රේල් 02 දක්වා හිඟ මුදල් වශයෙන් එකතුව රු.431,728 ක් පැවතුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පානදුර වරායේ වැලි ඉවත්කිරීම සඳහා අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම් ගතවී ඇප සුරක්ෂණයක්ද ලබාගැනීමකින් තොරව රු.20,000,000 ක මුදලක් අත්තිකාරම් එම සමාගමට ලබාදී තිබුණි. 2015 දෙසැම්බර් 10 දිනැති අතිරේක ගිවිසුමෙහි ගිවිසුම් කොන්දේසි අනුව පෞද්ගලික සමාගම විසින් කැණීම් කරන ලද වැලි විකුණා ලැබෙන මුදලින් අත්තිකාරම් මුදල හිලව්කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකී මුදල් අයකරගෙන නොතිබුණි.

(ආ) කොඩ්බේ ධීවර වරාය සතු ටොන් 100 ක දියත් මඟ, සේවක නේවාසිකාගාරය සහ යාන්ත්‍රික වැඩපල මාස 06 ක් තුළ අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු පදනම මත භාරදී තිබුණි. 2013 දෙසැම්බර් 29 දිනැති ගිවිසුම් ප්‍රකාරව මාස 06 ක් තුල අදාල අලුත්වැඩියා කළයුතු වුවද, එම අලුත්වැඩියා සිදුකර නොතිබුණි. බදු දීමේ මූලික අරමුණ වසර 13 ක් අකර්මන්‍යාව පැවති දියත්මග වැඩිදියුණු කිරීම වුවද විගණිත දිනය වූ 2018 අගෝස්තු 30 දිනට වසර 4 ½ ක කාලයක් ඉක්මවා තිබුණද බදුදීමේ මූලික අරමුණ ඉටුවී නොතිබියදී සමාලෝචිත වර්ෂය අවසාන වන විට බදු ගැනුම්කරුගෙන් හිඟ බදු ආදායම වූ රු.1,690,500 ක් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

වර්ෂ 06 කට වැඩි කාලයක සිට ගනුදෙනු වීමකින් තොරව වටිනාකම රු.224,749 ක් වූ බැංකු ගිණුම් 06 ක ශේෂ අක්‍රීයව පැවතුණි.

**4.6 නිෂ්ක්‍රීය වත්කම්**

------------------

පුරාණවැල්ල, සුදුවැල්ල, නිල්වැල්ල, තංගල්ල, ගාල්ල සහ කුඩාවැල්ල යන ධීවර වරායන් වලට අයත් සංචාරක බංගලා 03 ක්, ශීතාගාර 02 ක්, අයිස් යන්ත්‍රාගාර 03 ක්, ගොඩනැගිලි කඩකාමර 04 ක්, යාන්ත්‍රික වැඩපොලක් හා නිල නිවාසයක්ද යන්ත්‍ර හා උපකරණ 10 ක් ද වාහන හා යාත්‍රා 05 ක් ද භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත මුදාහැර ඇති සංස්ථාවේ සම්පත්**

----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රේඛීය අමාත්‍යාංශයට සහ වෙනත් රජයේ ආයතනවලට සංස්ථාවේ සේවකයන් 23 දෙනෙක් මුදාහැර තිබුණු අතර ඒ සඳහා රු.12,815,813 ක වැටුප් සංස්ථාව විසින් ගෙවා තිබුණද එම මුදල් අදාල ආයතන වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

(අ) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි 2017 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 1015 ක් වුවත් එදිනට සත්‍ය කාර්යමණ්ඩලය 1176 ක් විය. කාර්යමණ්ඩලයෙහි පුරප්පාඩු 313 ක් සහ 453 ක සේවක අතිරික්තයක් පැවතුණු අතර එම අතිරික්ත සේවක සංඛ්‍යාවෙහි අනුමත කාර්ය මණ්ඩලයේ නොවූ තනතුරු 25 ක නිලධාරීන් 404 දෙනෙක් විය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 8.2 වගන්තිය ප්‍රකාරව සේවයෙන් පහකළ නිලධාරියෙකු යළිත් සේවයට නොගන්නා බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා වගබලා ගතයුතු වුවද, ඊට පටහැනිව 2012 ජනවාරි 04 වන දින සිට මානව සම්පත් කළමනාකරණ තනතුර සඳහා රජයේ ආයතනයකින් විධිමත් විනය පරීක්ෂණයකින් සේවයෙන් පහකළ නිළධාරියෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ප්‍රකාරව වැටුප් සංශෝධන සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව මූල්‍ය කළමනාකාර තනතුර සඳහා වැටුප් වර්ධක 34 ක්ද, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන පෞද්ගලික සහකාර තනතුර සඳහා පරිවාස කාලය ඉක්මවීමටත් පෙර වැටුප් වර්ධක 15 ක් ද එකවර පිරිනමා තිබුණු අතර අභ්‍යන්තර විගණක හා විගණන නිලධාරී තනතුරුද නිවැරදි නොවන වැටුප් තලවල පිහිටුවීම සහ නීති නිලධාරීන් දෙදෙනෙකු වෙත මසකට රු.10,000 බැගින් විශේෂ දීමනාද ගෙවා තිබුණි.

(ඈ) 2010 අගෝස්තු 02 දින කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුරට වසරක කාලයක් සඳහා බඳවාගත් නිලධාරියෙකු, සංස්ථාවේ පවතින බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව මාසයක් තුළ නියෝජ්‍ය කළමනාකාර තනතුරට පත්කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් කාලය තුළ ඔහුගේ කාර්යක්ෂමතාව හා යෝග්‍යතාවය පරීක්ෂාවට ලක් කිරීමකින් තොරව 2012 ජනවාරි 06 දින සේවයේ ස්ථිර කර තිබුණි.

(ඉ) විගණිත දිනය වූ 2018 අප්‍රේල් 25 දිනට කිරින්ද ධීවර වරායේ සමස්ථ කාර්ය මණ්ඩලය 55 ක් විය. මෙම කාර්ය මණ්ඩලය තුළ ධීවර වරාය සතුව පාලම් තරාදියක් නොමැතිව පාලම් තරාදි ක්‍රියාකරුවකුද, තල්මසුන් නැරඹුම් යාත්‍රාවක් වරාය තුළ නොතිබියදී කොක්ස්වේන් හා සහායක ලෙස නිළධාරීන් දෙදෙනෙකුද , වරාය තුළ දොඹකර ක්‍රියාකාරීත්වයක් නොතිබියදී දොඹකර සහායකයකුද අනුයුක්තව සිටී.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම.

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද , ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව , අදාළ ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ දින 37 ක් ප්‍රමාදවී 2018 අප්‍රේල් 06 දින දීය.

### 6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 07 වන පරිච්ඡේදයට අනුව , ආයතනයක් විසින් වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේදී ආයතනය සඳහා අනුමත වාර්ෂික ඇස්තමේන්තුව, ක්‍රියාකාරී සැලැස්ම යනාදී ආයතනයේ සියළුම අංශයන් පිළිබඳව සලකා බලා එම සෑම අංශයකම කටයුතු ආවරණය වන පරිදි සහ සීමිත සම්පත් ඒවා කෙරෙහි යෙදවෙන ආකාරයට විගණන වැඩසටහන පිළියෙල කර ගතයුතු වුවත්, සංස්ථාව විසින් ක්‍රියාකාරී සැලැස්ම කෙරෙහි අවධානය යොමු නොකර වාර්ෂික විගණන වැඩසටහන පිළියෙල කර තිබුණි. තවද ආයතනයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ක්‍රියාවලි අතුරින් අවදානම් හඳුනාගෙන, එම අවදානම් වලින් ඇතිවන අයහපත් බලපෑම්ද එම අයහපත් බලපෑම් වලකාලීමට ඇති පාලන ක්‍රමවල දුර්වලතාද අධ්‍යයනය කර වඩාත්ම අවදානම් සහිත ක්‍රියාවලි පරීක්ෂාව කෙරෙහි වැඩි අවධානය යොමුකර ඒ අනුව විගණන වැඩසටහන් පිළියෙල කළ යුතු වුවත්, එලෙස අවදානම් ක්ෂේත්‍ර අනුව බර තැබීමකින් තොරව , 2017 වර්ෂය සඳහා වූ විගණන වැඩසටහන පිළියෙල කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා වූ විගණන සැලැස්ම තුළ ඉදිකිරීම් කටයුතු , ප්‍රසම්පාදනය , ස්ථාවර වත්කම් ලේඛනය, සේවක පාරිතෝෂික දීමනා , විගණන විමසුම් සඳහා වූ පිළිතුරු සැපයීම පරීක්ෂාවන් ආදී ක්ෂේත්‍ර 05 කට අදාලව විගණන කටයුතු වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක කරන බව දක්වා තිබුණද විගණිත දිනය වූ 2017 නොවැම්බර් 20 වන විටත් එම ක්ෂේත්‍රවලට අදාලව කිසිදු පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ඇ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009/01 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 09 වන පරිච්ඡේදයට අනුව , වාර්ෂිකව පිළියෙල කළ යුතු වාර්තාවන් සහ ඒවා ඉදිරිපත් කළයුතු ඉලක්ක දිනයන් දක්වා තිබුණද, අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික හා සාරාංශ වාර්තා දෙකක්ද සහ කාර්තුමය වාර්තාද පිළියෙල කර නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණකවරයාගේ වාර්තා සමාලෝචනය කිරීම හා පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධව කඩිනමින් කටයුතු කිරීම සිදු කළයුතු වුවත් , සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණන වාර්තා 18 ක් නිකුත්කර තිබුණද ඉන් විගණන වාර්තා 10 කට අදාළව ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 133 අනුව, අභ්‍යන්තර විගණන අංශයක ප්‍රධාන පරමාර්ථයක් ලෙස දෙපාර්තමේන්තුවෙහි මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතු වල වැරදි හා වංචා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යෑම දක්වා තිබුණද,මෙම අංශය මගින් එම අරමුණ ඉටුකරගැනීමට ප්‍රමාණවත් හා පිළිගත හැකි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ජී/2009/(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වත්කම් වාර්තාගත කිරීම හා අභ්‍යන්තර පාලනය පිළිබඳ අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටීන් සකස්කළ යුතු වුවද, 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මෙම ආයතනයෙහි වත්කම් සම්බන්ධයෙන් විධිමත් වාර්තාවක් විගණිත දිනය වන විටද සකස්කර නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.3.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2 වගන්තිය අනුව සංස්ථාව විසින් අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ සිවිල් ඉංජිනේරු අංශය සඳහා ජලජ මිනුම්දෝරු මෘදුකාංගයක් සහ මිනුම් උපකරණ මිලදී ගැනීමට රු.මිලියන1.1 ක් වෙන්කර තිබුණද එම අංශය විසින්, 2017 ජූලි මාසය වනවිට ඉන් රු.214,257 ක් වැයකර මැනුම් කටයුතු සඳහා වූ ක්ෂේත්‍රයේ වන වියදම් දරා තිබුණි.

(ii) හික්කඩුව හා කිරින්ද ධීවර වරායන්හි කැණීම් යාත්‍රා සඳහා අමතර කොටස් මිලදීගැනීමට රු.මිලියන 06 ක ප්‍රතිපාදන වෙන්කිරීම් ජාතික තරඟකාරී සහ වෙළඳපොල සැදැහුම් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ප්‍රසම්පාදනය කරන බව දැක්වුවද , එම ක්‍රමවේද අනුගමනය නොකර වරාය කළමනාකරු විසින් මිළදී ගැනීම් සිදුකර තිබුණි.

(iii) සංස්ථාව විසින් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබූ අතර, විගණිත දිනය වූ 2017 නොවැම්බර් 08 දින වන විටත්, සකස්කර ඇති ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය හෝ සමාලෝචනය කර නොතිබුණි. මේ නිසා ප්‍රසම්පාදනයේදී සිදුවන ප්‍රමාදයන් හඳුනාගැනීම සහ ඊට පාදක වූ හේතූන් පැහැදිලි කර ගැනීම , ඊට අවශ්‍ය ප්‍රතිකර්මීය පියවර ගැනීම යනාදී කාර්යයන් ක්‍රියාත්මක වී නොතිබුණි.

(iv) සංස්ථාව විසින් සකස්කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන සඳහා පමණක් සැලසුම් සකස් කර තිබුණද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනය සඳහා වෙන්කරන ලද රු.මිලියන 173.4 ක් සඳහා සැලසුම් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.මේ අනුව එම මුදලින් සැලැස්මකින් තොරව වර්ෂය තුලදී රු.110,712,612 ක් වැයකර තිබුණි.

(ආ) ධීවර වරායන් සඳහා 2012, 2015 සහ 2016 වර්ෂයන්වලදී බීකන් ලාම්පු 09 ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බීකන් ලාම්පු මිළදීගැනීමේදී, ලංසු විවෘත කිරීමේ කමිටුව වෙත ප්‍රමාද වී ඉදිරිපත් වූ ලංසුව ප්‍රතික්ෂේප නොකර භාරගෙන තිබූ අතර එම ප්‍රමාද වී ලද ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක්කර රු.344,000 ක් වූ ප්‍රසම්පාදන කාර්යය එම සැපයුම්කරුටම ප්‍රදානයකර තිබුණි.

(ii) ලංසු විවෘත කිරීමේ රැස්වීම් වාර්තාව , ලංසුකරුගේ නියෝජිතයන් හා ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයන්ගේ අත්සන්, එක් එක් ලංසුව නිරීක්ෂණය කළබව සහ මූල්‍ය තොරතුරු ආදිය පිළිබඳ ආකෘති පත්‍ර කිසිවක් සංස්ථාවේ ලංසු විවෘත කිරීමේ කමිටුව සම්පූර්ණ කර නොතිබුණි.

(iii) රාත්‍රී කාලයේ ධීවරයන්ට යාත්‍රා වරාය බෙසමට ලඟාවීම සඳහා බීකන් ලාම්පු අත්‍යාවශ්‍ය වුවද මිලදීගත් බීකන් ලාම්පු ධීවර වරායන් 07 ක ස්ථාපිතකර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් ජාතික තරඟකාරී මිලගණන් කැඳවීමේ ක්‍රමය යටතේ කොඩ්බේ, දික්ඕවිට , බේරුවල, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල සහ අම්බලන්ගොඩ ධීවර වරායන් සඳහා ඉන්ධන පොම්ප 08 ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදනයේදී සැපයුම්කරු තෝරා ගැනීමේ මූලික තාක්ෂණික පිරිවිතරය වූ මිනිත්තුවට ලීටර් 150 ක් නිකුත්වීම සම්පූර්ණ කරන ලද සැපයුම්කරුහට රු.19,121,000 ක වටිනාකමකට ඉන්ධන පොම්ප සැපයීම ප්‍රදානයකර තිබුණද සපයන ලද ඉන්ධන පොම්පවල ධාරිතාවය මිනිත්තුවට ලීටර් 138 ක් විය. මේ හේතුවෙන් සංස්ථාවේ අවශ්‍යතාවයට නොගැලපෙන ඉන්ධන පොම්ප මිලදීගෙන වරායන් තුල ස්ථාපිතකර තිබුණු අතර එම ඉන්ධන පොම්ප භාවිතයට නොගෙන නිෂ්කාර්ය පවතින බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ)(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.4.4 ඡේදය අනුව පිළිගත හැකි අත්තිකාරම් සුරක්ෂණයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිම අත්තිකාරම් මුදලක් පමණක් ගෙවිය හැකි වුවත් ඊට පටහැනි ලෙස සංස්ථාව විසින් ගාල්ල, මිරිස්ස, කුඩාවැල්ල සහ බේරුවල ධීවර වරායන් සඳහා පාලම් තරාදි 04 ක් මිලදීගැනීම සඳහා අත්තිකාරම් සුරක්ෂණයක්ද ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 66 ක් වන රු.4,950,000 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි.

(ii) භාණ්ඩ සැපයීමේ කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 23 දින පිරිනමා විගණිත දිනය වූ 2018 ජූනි මාසය වන විට මාස 17 ක් ගතවී තිබුණද කොන්ත්‍රාත්කරු විසින් කිසිඳු වරායක පාලම් තරාදි ස්ථාපිත කර නොතිබුණි. මේ හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

**6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

අමාත්‍යතුමාගේ නිල නිවස අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.9,466,475 ක් වුවද අලුත්වැඩියා කටයුතු අවසානයේ සහතික කරන ලද වැඩ වටිනාකම රු.12,239,356 ක් වී තිබුණි. මේ අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා සියයට 29 ක් හෙවත් රු.2,772,881 ක් ගෙවීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත් 8.13.4 ඡේදය අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**6.4 අයවැය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කළයුතු අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

**6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2014, 2015 හා 2016 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2018 අගෝස්තු 15 දින වන විටත් සභාගත කර නොතිබුණි.

**6.6 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මීගමු කළපු වෙරළ සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.1,225,000 ක් වූ ටී ෂර්ට් 1,500 ක් හා කැප් 2,000 ක් මිලදීගැනීමට කටයුතු කර තිබූ අතර මෙම භාණ්ඩ ලැබූ බවට තහවුරු කරගැනීමකින් තොරව අදාල පෞද්ගලික ආයතනයට ගෙවීම් කටයුතු කර තිබුණි.

(ආ) මීගමු වෙරළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාල කළපු වෙරළ සංවර්ධනය කිරීමේ ආරම්භක උත්සවය සඳහා වන වියදම රු.13,270,000 කට ඇස්තමේන්තු කර ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් වෙත අත්තිකාරම් මුදල් ලෙස රු.5,000,000 ක් ගෙවා තිබුණි. එහෙත් එම උත්සවය පැවැත්වූ බවට සනාථ කිරීම සඳහා කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) මීගමුව කළපු වෙරළ සංවර්ධනය කිරීමේ උත්සවය වෙනුවෙන් සමරු ඵලකයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.1,848,000 කට පවරා දී තිබූ කොන්ත්‍රාත්තුවට අදාලව 2014 වර්ෂය තුල රු.1,000,000 ක් අත්තිකාරම් ලබාදී තිබුණි. සමරුඵලක ඉදිකිරීමේ සැලැස්මට අනුව කලුගලින් අඹන ලද මාළුවකුගේ රූපයක් නිර්මාණය කළයුතු වුවද , සිමෙන්තියෙන් පිළියෙල කරන ලද මාළුවකුගේ නිර්මාණයක් තිබූ බව 2014 පෙබරවාරි 16 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව කුලී පදනම මත ලබා දීමට අදාලව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 23 දින පෞද්ගලික සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව බදුකාර සමාගම විසින් යාත්‍රාව සන්තකයේ තබාගත් දිනකට රු.200,000 බැගින් සමාලෝචිත වර්ෂයේ දින 28 ක් එකතුව රු.5,600,000 ක් බදුකාර සමාගමෙන් අයකර ගතයුතු වුවද , ඉන් රු.1,600,000 ක් පමණක් අයකරගෙන තිබුණි. තවද ගිවිසුම් කොන්දේසි වලට පටහැනිව ඉන්ධන, ජලය , සේවක වැටුප් , අතිකාල හා දීමනා ලෙස ගෙවන ලද රු.1,409,960 ක් ද ඇතුළුව එකතුව රු.5,409,960 පෞද්ගලික සමාගමෙන් අයකර ගැනීමට 2017 ඔක්තෝබර් මාසය වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2007 වර්ෂයේදී නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තාවකට අනුව සැපයුම් අංශයෙහි රාජකාරී කටයුතු භාරව සිටියදී රජයේ මුදල් අවභාවිතා කිරීමට සම්බන්ධ ලිපිකරු නිලධාරිණියකගෙන් රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමකින් හා විනය පරීක්ෂණයකින් තොරව 2014 මැයි 05 සිට ඇය නැවත එම අංශයටම අනුයුක්ත කර තිබුණි.

(ඊ) කිරින්ද වරායේ වැලි ඉවත්කිරීම සඳහා 2015 වර්ෂයේ ජුනි මාසයේදී සංස්ථාව සමග ගිවිසුම්ගතවී තිබුණ පෞද්ගලික ආයතනය , එම ගිවිසුම පරිදි කටයුතු කර නොතිබීම නිසා , ගිවිසුමේ වගන්ති අංක 08 අනුව ගිවිසුම අවලංගු කර තිබුණද රු.200,000 තැන්පතුව ආයතනයට පවරාගැනීම සිදුකර නොතිබුණි. එසේ තිබියදී හම්බන්තොට වරායේ වැලි ඉවත්කිරීම් කටයුතු ද 2015 වර්ෂයේ අගෝස්තු සිට එම ආයතනයටම පවරා තිබූ අතර එහි වැලි ඉවත් කිරීමේ කටයුතුද සිදුකර නොතිබුණි. මේ නිසා ධීවර යාත්‍රා වලට වරායට ළඟා වීමට නොහැකි වීම හා ධීවරයන්ට පහසුකම් සැපයීම යන අරමුණ ඉටු වී නොතිබුණද මේ සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි.

(උ) 2014 පෙබරවාරි 18 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග ඉටුකර නොතිබුණි.

(i) පාඩු ලබන වරායන් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීම සඳහා කමිටුවක් පත්කර ඊට විසඳුම් සොයා ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ණය පදනම මත සපයන ලද ඉන්ධන සඳහා අයකරගැනීම හා නඩු 10 ක් විභාගවීම පිළිබඳව හා අයකරනොගත් ණය ශේෂ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවන් විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් දී තිබුණද එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ණයට ඉන්ධන සැපයීම නතර කරන ලෙස දන්වා තිබුණද එකී කමිටු තීරණයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ වන විට සහ ඉකුත් වර්ෂ 02 ක සඳහා රු.මිලියන 69 ක ඉන්ධන ණය පදනම මත නිකුත් කර තිබුණි.

(iv) මෝදර ධීවර වරායේ නැංගුරම් ලා තිබූ යාත්‍රාවෙන් නැංගුරම් ගාස්තු රු. 5,675,373 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) නව බඳවාගැනීමේ පරිපාටිය සකස්කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට උපදෙස් දී තිබුණද 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම බඳවාගැනීමේ පටිපාටි සකස්කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(vi) චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් එකී වැරදි නිවැරදි කිරීමට ගෙන ඇති පියවර විගණනයට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද වසර 04 ක කාලයක් ගතවී ඇතත් එම කමිටු තීරණ අනුව නිවැරදි වැටුප් කාණ්ඩ සැකසීමට කටයුතු කර නොතිබුණි.

(vii) පෙර ගෙවුම් අත්තිකාරම් ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තාවක් සහ කමිටු තීරණ ක්‍රියාත්මක නොකිරීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(viii) වටිනාකම රු.5,065,075 ක් වූ ඉන්ධන ටැංකි 06 ක් සැපයීම සඳහා 2007 වර්ෂයේදී රු.2,791,215 ක අත්තිකාරම් ගෙවා තිබුණද එම ඉන්ධන ටැංකි සංස්ථාවට නොලැබීම පිළිබඳව ඊට වගකිව යුතු සැපයුම් කළමනාකරුට එරෙහිව කටයුතු කිරීමට උපදෙස් දී තිබුණද එකී උපදෙස් අනුව , විනය පරීක්ෂණයක් නොමැතිව සහ ගෙවූ මුදල් අයකරගැනීමෙන් තොරව එම සැපයුම් කළමනාකරු නැවත සේවයේ පිහිටුවා තිබුණි.

## 6.7 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දොඩම්දූව ධීවර වරාය පරිශ්‍රය තුළ ක්‍රියාත්මක වන භූමිතෙල් පිරවුම්හල සඳහා හික්කඩුව නගර සභාවෙන් වාර්ෂිකව ලබාගතයුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය 2018 වර්ෂය සඳහා ලබාගැනීමට විගණිත දිනය වූ 2018 මාර්තු 20 වන දින තෙක්ම කටයුතු කර නොතිබුණි.

(ආ) දෙවිනුවර පුරාණවැල්ල සහ ගාල්ල ධීවර වරායන්වල කැඩිබිඳී විනාශ වී ගිය පිළිවෙලින් යාත්‍රා 23 ක් හා යාත්‍රා 25 ක් වරාය පරිශ්‍රයේ ගොඩගසා තිබූ අතර ඒවා පරිශ්‍රයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීමෙන් විවිධ පාරිසරික ගැටළු ඇතිවී තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) සේවක ණය කළමනාකරණය | (i) සේවක ණය, වැටුප් අත්තිකාරම් ණය හා වෛද්‍යාධාර ණය සම්බන්ධයෙන් ණය ලේඛන විධිමත් පරිදි පවත්වා ගෙන නොතිබීම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| | (ii) වර්ෂ ගණනකාවක සිට පැවත එන හඳුනානොගත් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| | (iii) නිල්වැල්ල හා කුඩාවැල්ල ධීවර වරායන්වල හිස් චෙක්පත් 02 ක් අත්සන් කිරීම හා භාරගැනීම සිදුකර තිබීම. |
| | (iv) නිල්වැල්ල ධීවර වරායේ ලිපිලේඛන කටයුතු සඳහා දෙපස ලියවෙන කාබන් කොළ භාවිතා කර නොතිබීම. |
| | (v) ඉන්ධන අලෙවිය සහ වෙනත් සේවාවන් සඳහා මුදල් අයකිරීමේදී විධිමත් මුදල් කුවිතාන්සියක් නිකුත් නොකරන අතර විෂය ලිපිකරුවන් විසින් තාවකාලිකව රිසිට් පතක් මත මුදල් අයකිරීම , මුදල් භාරකරුවෙකු සිටියද විෂය ලිපිකරුවන් විසින් එකී කටයුතු ඉටු කිරීම , මුදල් ලැබීම් වෙනුවෙන් ලැබීම් වවුචරයක් සකස් නොකිරීම, සේප්පුවේ මුදල් තැන්පත් කිරීමේදී විධිමත් පාලන ක්‍රමයක් අනුගමනය නොකිරීම , මුදල් පොතක් සකස් කර දෛනිකව තුලනය කර එහි ශේෂය අතැති මුදල් සමඟ සැසඳීමක් සිදුනොකිරීම, රක්ෂිත සීමාව ඉක්මවා මුදල් අතරඳවා ගැනීම. |

| | |
|---|---|
| | (vi) මුදල් පොත්, ලැබීම් සහ ගෙවීම් අනුව කාලානුක්‍රමයට පිළිවෙලින් පවත්වා ගෙන යා යුතු අතර දිනපතා තුලනය කරමින් අධීක්ෂක හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්සන් කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබීම. |
| (ඈ) ආදායම් පාලනය | ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පරිපාටි අනුමත කරගෙන නොමැති වීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වැටුප් වැඩිවීම් හා බඳවාගැනීම් සිදුකර තිබීම සහ බඳවාගැනීම් විනිවිදභාවයකින් තොරව සිදු කිරීම හා සංස්ථාවේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනිමට කටයුතු නොකිරීම. |
| (ඉ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොමැතිවීම හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකර නොතිබීම. |
| (ඊ) අභ්‍යන්තර විගණනය | (i)ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුනොවීම හා අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී නොතිබීම.<br>(ii)අභ්‍යන්තර විගණන සැලැස්මේ එක් එක් කාර්යය සඳහා මිනිස් දින ප්‍රමාණයන් වෙන් වෙන්ව දක්වා නොතිබීම. |
| (උ) ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්ම තුළ භාණ්ඩ, සේවා හා වැඩ යනාදී ලෙස ප්‍රසම්පාදන කටයුතු වර්ගීකරණය නොකිරීම. |